2024 නොවැම්බර් 1

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
6/5, ලේයාර්ඩ්ස් පාර,
කොළඹ 5,
ශ්‍රී ලංකාව

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා,
ජනාධිපති ලේකම් කාර්යාලය, ගාලු මුවදොර,
කොළඹ 1,
ශ්‍රී ලංකාව

අතිගරු ජනාධිපතිතුමනි,

2024 සැප්තැම්බර් මස පැවති ජනාධිපතිවරණයේ සිට නොවැම්බර් මස පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය දක්වා වන කාලය අතරතුර ශ්‍රී ලංකාව කාර්යබහුල සති කිහිපයක් පසු කර ගොස් තිබේ. ගැටළු රාශියක් කෙමෙන් වර්ධනයවන අතරතුර, ඔබතුමන්ගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු මූලික පොරොන්දු සම්බන්ධයෙන් වහා පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලෙස අප ඔබතුමන් වෙත මෙම ලිපිය යොමු කරන්නෙමු. ශ්‍රී ලංකාව දිගින් දිගටම විවිධ අභියෝගවලට මුහුණ දෙමින්, ආර්ථික අර්බුදයකින් සහ ප්‍රචණ්ඩත්වයේ චක්‍රයෙන් ගොඩ ඒමේ මාවතේ ඉදිරියට ගමන් කරමින් සිටින සන්දර්භයක් තුළ, වහා අවධානය යොමු කළ යුතු තීරණාත්මක කරුණු කෙරෙහි ඔබතුමන්ගේ අවධානය යොමු කිරීමට අපි අදහස් කරන්නෙමු.

2022 පැන නැගුණු අරගලය මගින් දූෂණයට එරෙහිව මෙන්ම මහජන විශ්වාසය පළුදු වීමට හේතුවන වගවීම් විරහිතභාවයට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා ලෙසට වූ ප්‍රබල ඉල්ලීම් සමගින් පාලන ප්‍රතිසංස්කරණවල හදිසි අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. මෙම සන්දර්භය තුළ, විධායකය විසින් සියල්ල අතික්‍රමණය කිරීම, ආයතන දේශපාලනීකරණය වීම සහ දණ්ඩමුක්තියේ සංස්කෘතිය ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ පාලන ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ තීරණාත්මක අවශ්‍යතාවය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු අනෙකුත් පාර්ශවකරුවන් විසින් ඉස්මතු කරන ලදී. මේ සම්බන්ධයෙන් අර්ථවත් පාලන ප්‍රතිසංස්කරණ ඇති කිරීමටත්, රටේ දූෂණ සංස්කෘතියට එරෙහිව සටන් කිරීමටත්, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ඇතුළු වගවීම ස්ථාපනය කිරීමටත් මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය අතරතුර ඔබතුමන් ප්‍රකාශකොට සිටි කැපවීම අපි සැලකිල්ලට ගන්නෙමු.

තවද, ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩත්වය සහ බිඳෙනසුලු සාමය පිළිබඳ අත්දැකීම් මෑතකාලීන සිදුවීම් මගින් නැවත වරක් සිහිපත් කරයි. ගැටුමේ මූල හේතූන් විසඳීමට කලින්කල බලයට පැමිණි ආණ්ඩු අසමත් වීම

සමාජ බෙදීම් තව දුරටත් ගැඹුරට කාවැදීමට හේතු වී ඇති අතර, තීව්‍ර මට්ටමේ අවේක්ෂණයක් පවතින ගැටුම් උග්‍ර කිරීමටත්, නව ආතතීන් අවුලුවාලීමටත්, ඇති අවදානමේ විභවතාවය ඉහළ නංවා ඇත. විශේෂයෙන්ම, පසුගිය ඔක්තෝම්බර් මාසයේ දී ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කළ බවට වාර්තා වන තත්වයක් තුළ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු පීඩාකාරී නීති ඉවත් කිරීමට ඔබතුමන් ලබා දුන් ප්‍රධානතම ප්‍රතිඥාවක් සම්බන්ධයෙන් ඇති වනුයේ කනස්සල්ල දනවන සුළු තත්ත්වයකි.

ඉහළ යන අභියෝග මධ්‍යයේ, ඔබතුමන් විසින් ඔබතුමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ලබා දී ඇති පොරොන්දු වෙත නැවත පැමිණ විනිවිදභාවයෙන් සහ සියල්ලන් ඇතුළත් වන ආකාරයෙන් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ආරම්භ කිරීම ඉතා වැදගත් වේ. මෙකී වෙනස්කම් බොහොමයකට ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වන අතර එය නව පාර්ලිමේන්තුව කැඳවීමෙන් පසුව පමණක් සිදු කල හැකි බව ද අපි සැලකිල්ලට ගනිමු. කෙසේ වෙතත්, රජය ලබා දුන් පොරොන්දු කෙරෙහි ඇති කැපවීම නැවත තහවුරු කර නව පාර්ලිමේන්තුවට ප්‍රමාදයකින් තොරව මෙම ප්‍රතිසංස්කරණ සමඟ ඉදිරියට යාමට ඉඩ සැලසෙන පරිදි අවශ්‍ය සූදානම් කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලෙස අපි ඉල්ලා සිටින්නෙමු.

## 1. පාලනය සහ වගවීම

●ස්වාධීන ආයතනඃ විධායක බලය සම්බන්ධයෙන් සන්වරනය සහ තුලනය ප්‍රමාණවත් ලෙස ඇති කිරීම සහ ස්වාධීන නියාමන ආයතන දේශපාලන මැදිහත්වීම් වලින් තොර වන බවට සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම මෙන්ම ඵලදායි අධීක්ෂණ යාන්ත්‍රණයන් පැවතීම මෙම දිසාව කරා යන ගමනක තීරණාත්මක පියවරයන් වේ.

● දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමඃ දූෂණ විරෝධී නීති සහ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සහ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. ස්වාධීන රාජ්‍ය අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කරන ලෙසත් දූෂණයට අදාළ වැරදි සම්බන්ධයෙන් පැහැදිලි වගවීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කරන ලෙසත් අපි ඉල්ලා සිටින්නෙමු. අල්ලස් හා දූෂණ සම්බන්ධ නඩු විභාග කිරීම සහ නඩු පැවරීම සඳහා දැනටමත් ස්ථාපනය කර ඇති ආයතන උදෙසා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරන ලෙසද අපි ඉල්ලා සිටින්නෙමු. මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා තාවකාලික මුලපිරීම් ස්ථාපනය කිරීම අපි අධෛර්යමත් කරන්නෙමු, ඒ එවැනි යාන්ත්‍රණයන් අසාර්ථක බව අතීතයේ දී ඔප්පු වී ඇති බැවිනි.

●තීරණාත්මක සිදුවීම්ඃ ඉහළ පෙළේ වැදගත්කමක් සහිත සිදුවීම් සම්බන්ධ විමර්ශන විනිවිදභාවයෙන් යුක්තව පවත්වාගෙන යාම මෙන්ම ඒ හා සම්බන්ධ වගවීම සහතික කිරීම මහජන විශ්වාසය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඉතා වැදගත් වේ. පාස්කු ඉරිදා ප්‍රහාරය ඇතුළු අනෙකුත් තීරණාත්මක සිදුවීම් කිහිපයක් සම්බන්ධයෙන් විමර්ශන කඩිනම් කිරීම ද ඊට ඇතුළත්ය.

## 2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ නීති සම්පාදන ක්‍රියාවලිය

● විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමඃ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධ ඉල්ලීම් දිගු කලක් තිස්සේ පැවති අතර, ඔබතුමන් ජනාධිපති ධූරයට තේරී පත් වූයේ ශ්‍රී ලංකාවේ අවසන් විධායක ජනාධිපතිවරයා වන බවට වන කැපවීමක් ද සමඟිනි. මේ සම්බන්ධ දේශපාලන නායකත්වය ලබා දී ප්‍රතිසංස්කරණ ආරම්භ කරන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටින්නෙමු.

●නීති සම්පාදන ක්‍රියාවලිය: දේශීය විශේෂඥතාව සහ මහජන මත විමසීම ද අන්තර්ගත කරමින් නීති සම්පාදනයේදී උපදේශනාත්මක, බහු-පාක්ෂික සහ විනිවිද භාවයෙන් යුත් ක්‍රියාවලීන්හි වැදගත්කම අපි අවධාරණය කරන්නෙමු. මේ සම්බන්ධයෙන් වන ස්ථාවර නියෝගවලට සුදුසු සංශෝධන සිදු කරන ලෙස ද අපි ඉල්ලා සිටින්නෙමු.

●13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් බලාත්මක කිරීම: 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීම පෙන්වා දිය හැක්කේ මෙරට ජාතික ප්‍රශ්නය සහ දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ සුළු ජාතීන්ට පවතින දුක්ගැනවිලි විසඳීමට ඇති කැපවීම පෙන්නුම් කෙරෙන පළමු පියවර වශයෙනි. පවතින ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම වාර්ගික සහ ආගමික සුළුතරයන්ගේ විශ්වාසය ඉහළ නැංවීම සඳහා වැදගත් පූර්ව අවශ්‍යතාවයක් වන අතර ඔබතුමන් විසින් ලබා දුන් නිලයේ දිවුරුම හා සබැඳි කැපවීම නැවත තහවුරු කරන්නක් බව අපි මෙසේ සටහන් කරන්නෙමු.

● නීති ප්‍රතිසංස්කරණ: යෝජිත නීති මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීමට මෙන්ම, රටේ සුළුතර කණ්ඩායම් අසමානුපාතික බලපෑමට ලක්වන පරිදි නීති අවභාවිතා කිරීමෙන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඊට ඇතුලත් කරන ලෙස අපි ඉල්ලා සිටින්නෙමු. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ 2024 මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත අවලංගු කරන ලෙස අපි විශේෂයෙන් ඉල්ලා සිටින්නෙමු. ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත සහ රාජ්‍ය නොවන සංවිධාන පනත් කෙටුම්පත වැනි යෝජිත නීතිමය ප්‍රතිසංස්කරණ අර්ථවත් සහ පුළුල් මහජන මත විමසුම් ක්‍රියාවලියක් මත පදනම්ව නැවත සලකා බැලිය යුතුය.

### 3. සංහිඳියාව

●අතීත ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ විමසා බැලීම: ශ්‍රී ලංකාව පුරා විසිර සිටින වින්දිතයන්ගේ යුක්තිය සහ සත්‍යය සෙවීමේ ඉල්ලීම්වලට විසඳුම් සෙවීම සඳහා අවංක උත්සාහයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. දණ්ඩමුක්තිය සම්බන්ධව මුල් බැස ගෙන ඇති සංස්කෘතිය වෙනස් කිරීමේ ආමන්ත්‍රණය පරමාර්ථ කොටගෙන වගවීම සහ සත්‍යය පැවසීම සම්බන්ධයෙන් ස්වාධීන ක්‍රියාවලීන් ආරම්භ කිරීම මෙයට ඇතුළත් විය යුතුය.

●ඉඩම් අයිතිය: ඉඩම් පවරා ගැනීම නතර කර ඉඩම් නියම අයිතිකරුවන්ට ආපසු ලබාදීමට වහාම පියවර ගත යුතුය. පුනරුත්ථාපනය ආමන්ත්‍රණය කෙරෙන විස්තීරණ වන්දි වැඩසටහනක් සඳහා දේශපාලන නායකත්වය ද අත්‍යවශ්‍ය වේ..

● හමුදාකරණය: උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල හමුදාව රඳවා තැබීම අවම කිරීම සහ හමුදාව සතු ඉඩම් නිදහස් කිරීමට සමගාමීව ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණ සිදු කිරීම සංහිඳියා ප්‍රයත්නයන්ට උපකාරී වේ. වානිජ සහ සිවිල් පරිපාලන කටයුතුවලින් හමුදාව ඉවත් කිරීමට ද පියවර ගත යුතුය.

### 4. ව්‍යුහාත්මක අසමානතා

●සමාජ-ආර්ථික අයිතිවාසිකම් ආමන්ත්‍රණය කිරීම: සෞඛ්‍ය, අධ්‍යාපනය, සනීපාරක්ෂාව සහ පානීය ජලය ඇතුළු මූලික පහසුකම් සඳහා ප්‍රවේශය ඇතැම් ප්‍රදේශවල පවතිනුයේ සීමා සහිත මට්ටමකය. අවශ්‍ය

සම්පත් ලබා දීම මෙන්ම, මෙම ප්‍රදේශවල යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම අධ්‍යාපනය, මහජන සෞඛ්‍යය, යහපැවැත්ම සහ සමස්ත ජීවන තත්ත්වයේ ගුණාත්මක බව ප්‍රවර්ධනය කිරීම සඳහා උපකාරී වේ.

● සාධාරණ ආධාර යෝජනා ක්‍රම: අස්වැසුම සහ සමෘද්ධි යෝජනා ක්‍රම ඇතුළු රජයේ මුලපිරීම් හරහා අරමුදල් බෙදා හැරීම සම්බන්ධයෙන් වූ දැඩි ලෙස සැලකිල්ලට යොමුවිය යුතු තත්ත්වයන් පවතී. සැබෑ අවශ්‍යතා ඇති අයට සහාය ලබා ගැනීමට සහ අසමානතා දුරලීමේ ක්‍රියාවලියක් ආරම්භ කෙරෙන බවට සහතික කිරීම සඳහා සුබසාධන යෝජනා ක්‍රමවල පවතින මෙවැනි හිඩැස් ආමන්ත්‍රණය කිරීම අත්‍යවශ්‍ය වේ.

● කාන්තාවන්ගේ සහ අවදානමට ලක්වන කණ්ඩායම්වල ණය බර ආමන්ත්‍රණය කිරීම: මලයහ කඳුරට (දෙමළ) ප්‍රජාව සහ ආදිවාසී කණ්ඩායම් ඇතුළු බොහෝ කාන්තාවන් සහ ආන්තික ප්‍රජාවන් ආර්ථික සංචලනය සීමා කිරීමට සහ දරිද්‍රතාවයේ චක්‍රයන්ට දැඩි ලෙස ගොදුරු වීමට හේතුවන ණය බර හේතුවෙන් අසමාන ලෙස පීඩාවට පත්ව සිටිති. මෙම බරින් මිදීමට සහ මෙම කණ්ඩායම් අතර ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඉලක්කගත මැදිහත්වීම් සහ තිරසාර මූල්‍ය ආධාරක යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අපි පෙනී සිටින්නෙමු.

●තිරසාර ජීවනෝපායන් සහ ස්ථාවර රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම: දිගුකාලීන ආර්ථික ප්‍රකෘතිමත් වීමක් සාක්ෂාත් කර ගැනීම සඳහා තිරසාර ජීවනෝපායන් සහ සුරක්ෂිත රැකියා අවස්ථා අත්‍යවශ්‍ය වේ. ස්ථාවර රැකියා, නිපුණතා සංවර්ධනය සහ තිරසාර ආර්ථික අවස්ථා සඳහා සියලු ප්‍රජාවන් හට ඇති ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති සහ වැඩසටහන් නිර්මාණය කිරීම අපි දිරිමත් කරන්නෙමු.

ඉහත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග වැඩි දුර ප්‍රමාදයකින් තොරව ආරම්භ කරන ලෙස අපි ඔබතුමන්ගෙන් ඉල්ලා සිටින අතර ශ්‍රී ලංකාව තුළ එසේ සිදුවන ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණවල ඉදිරිගමන හා සම්බන්ධව කටයුතු කිරීමට අපි උනන්දුවෙන් සිටිමු.

ස්තුතියි